**දකුණු පළාත් සභාව - 2013**

දකුණු පළාත් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන්කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 -1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පළාත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට දකුණු පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 පළාත් සභා අරමුදල

සමාලෝචිත වර්ෂයේ පළාත් සභා අරමුදල් ගිණුම 2014 අප්‍රේල් 21 දින විගණනයට ඉදිරිපත් කරන ලදී. 2013දෙසැම්බර් 31 දිනට පළාත් සභා සමුච්චිත අරමුදල රු.(104,099,540) ක්වූ අතර එය 2012දෙසැම්බර් 31 දිනට රු. 373,144,340 ක් විය. 2012වර්ෂයට සාපේක්ෂව 2013වර්ෂයේ දී පළාත් සභා අරමුදල රු. 477,243,880 කින් පිරිහී තිබුණි.

#### 2.2.2 අනෙකුත් ගිණුම්

සමාලෝචිත වර්ෂයට අදාලව 2014 මාර්තු 31 දිනට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කළ ගිණුම්සංඛ්‍යාව | ඉදිරිපත් නොකළගිණුම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | විසර්ජන ගිණුම් | 26 | 21 | 05 |
| (ii) | ආදායම් ගිණුම් | 01 | 01 | - |
| (iii) | පළාත් රාජ්‍ය නිළධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 92 | 55 | 37 |
| (iv) | වාණිජ අත්තිකාරම් ගිණුම් | 11 | 01 | 10 |
| (v) | අරමුදල් ගිණුම් | 06 | 03 | 03 |
| (vi) | ප්‍රඥප්ති ගිණුම් | 05 | 02 | 03 |
| (vii) | වත්කම් බැරකම් ප්‍රකාශය | 01 | 01 | - |
| | එකතුව | 142 | 84 | 58 |

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් 2014 මාර්තු 27 දින පළාත් සභා අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත්කර තිබුණු මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පළාත් සභා අරමුදලින් ජනිතවූ රු.946,693,497 ක්වූ වත්කම් ඇතුළත් කර නොතිබුණි.

(ආ) පළාත් සභා අරමුදලේ මූල්‍ය ප්‍රකාශන වල2012 දෙසැම්බර් 31 දිනට ඒක්ෂණ තැන්පත් පොලී ගිණුමේ ශේෂය රු.56,502,307 ක් වූ අතර, මේ සම්බන්ධයෙන් ප්‍රධාන ලෙජරයේ ගිණුමක් විවෘත කර නොතිබුණි.

### 2.2.4 නොසැසඳූ පාලන ගිණුම්

රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් 3 ක දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂයන් සහ දකුණු පළාත් සභා අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ශේෂයන් අතර රු.697,046 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

ආයතන 3 කට අදාල වර්ෂ 01 සිට 03 ක කාලයක් ඉක්මවූ ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම පිළිවෙලින් රු.315,870,140 ක් හා රු.7,353,052 ක් විය.

### 2.2.6 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

ආයතන 3 කට අදාල එකතුව රු.218,775,195 ක් වූ ගනුදෙනු සම්බන්ධයෙන් වූ සාක්ෂි විගණනට ඉදිරිපත් නොකෙරුණි. (විස්තර ඇමුණුම් අංක 1 හි දැක්වේ)

## 2.2.7 නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලටඅනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය විය.

| | නීති,රීති, රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදය | | |
| (i) | 1.6 වගන්තිය | 55,877,546 | නිලධාරියෙකු ස්ථානමාරු කරනු ලැබූ විට ඔහු මාරු කරන ලද්දේ යම් දෙපාර්තමේන්තුවකටද එම මාරුවී යන දෙපාර්තමේන්තුවට ලියා යවා අයවිය යුතු ණය ශේෂය පියවා ගතයුතු වුවද ආයතන 12 කින් අයවිය යුතු ණය ශේෂ 2013 දෙසැම්බර් 31දින තෙක් පියවා ගෙන නොතිබුණි. |
| (ii) | 4.1 , 4:2:3 හා 4.6 වගන්ති | 618,805 | සේවය හැර ගිය, විශ්‍රාම ගිය හා මියගිය නිලධාරින් ගෙන් අයවිය යුතු ණය ශේෂ නිරවුල් කර ගැනීමට 2013 දෙසැම්බර් 31 වන විටත් කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| | 1645 (අ - ආ) සහ 1646 | | මාතර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් වාහන 24 ක හා මාතර, මොරවක, මුලටියන , අධ්‍යාපන කාර්යාලවලට අදාල ධාවන සටහන් අඛණ්ඩව විගණකාධිපති වෙත ලැබී නොතිබුණි. |
| (ඇ) | දකුණු පළාත් සභා මුදල් රීති සංග්‍රහය | | |
| (i) | රීති 30 | 183,683,240 | මාතර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය 2013 වර්ෂයේ වැය විෂයයන් 18 කට අදාළව ප්‍රතිපාදන ඉක්මවා රු.183,683,240 ක වියදම් දරා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ii) | රීති 52 | 901,813 | ආහාර හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයට අයත් 2012 සැප්තැම්බර් 05 දින අනතුරට පත්ව තිබූ වාහනයක අලාභය වන රු. 777,690 ක මුදල හා අධිවේගී මාර්ගයට සිදු වූ අලාභය සඳහා ගෙවා තිබූ රු.124,123 ක වන්දි මුදල විසර්ජන ගිණුම තුල දක්වා නොතිබුණි. |
| (iii) | රීති 54 | | 2013 ජුනි 13 දින පස්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට අයත් වෑන්රථයේ පිටුපස දොරට හා ලාම්පු කවර වලට හානිවී තිබූ අතර 2013 දෙසැම්බර් 31 දින දක්වා මූලික විමර්ශන හෝ සිදුකර නොතිබුණි. |
| (iv) | රීති 113.3 | 460,115 | ලැබෙන සෑම මුදලක් සඳහාම කුවිතාන්සියක් නිකුත් කළයුතු වුවද හම්බන්තොට දිස්ත්‍රික්කයේ සූරියවැව දිසා රෝහල රෝගීන්ගෙන්, ආයතන හා පුද්ගලයින්ගෙන් 2010 වර්ෂයේ සිට 2013 අගෝස්තු 23 දින දක්වා එකතු කරන ලද මුදල් සම්බන්ධයෙන් ලදුපත් නිකුත් කර නොතිබුණි. |
| (v) | රීති 117.1 හා 117.4 | 84,324 | දිනපතා එකතුවන මුදල් දිනපතා හෝ හැකිතාක් ඉක්මනින් බැංකුවේ තැන්පත් කළයුතු වුවද එසේ එකතු වන මුදල් මාසයක් පමණ අත රඳවාගෙන තිබුණි. |
| **(ඇ)** | **අධ්‍යාපන අමාත්‍යාංශය චක්‍රලේඛ** | | |
| | 2003 නොවැම්බර් 07 දිනැති අංක 2003/38 දරන පාසැලක ගුරු අවශ්‍යතාවය සැපයීමේ අරමුණෙන් ගුරු සංඛ්‍යාව නිර්නය කිරිමේ චක්‍රලේඛයේ 2.1.6 ජේදය | | චක්‍රලේඛයට පටහැනිව ගාල්ල කලාපයේ පාසැල් 20 ක වැඩ බලන විදුහල්පතිවරුන් සේවයේ යොදවා තිබුණි. |
| **(ඉ)** | **දකුණු පළාත් ප්‍රධාන ලේකම් චක්‍රලේඛ** | | |
| **(i)** | 2013 ජුනි 27 දිනැති අංක 02/2013 දරන චක්‍රලේඛය | 254,749 | 314-44-3 ගිණුමෙන් වැය විෂය අංක 1301 යටතේ මුදලක් අවුරා නොතිබීම. |
| (ii) | 2014 ජුලි 30 දිනැති අංක 2/2014 දරන චක්‍රලේඛය | 7,456,933 | අදාල චක්‍රලේඛයට පටහැනිව ගාල්ල දිස්ත්‍රික් වාරිමාර්ග කාර්යාලය 2013 ජනවාරි සිට දෙසැම්බර් දක්වා බාජ් යන්ත්‍ර කුලියට ගෙන යන්ත්‍ර පැය 4235 ක් සේවයේ යොදවා ගෙන තිබුණි. |

| | | |
|---|---|---|
| - එම - | 480,000 | අදාල චක්‍රලේඛයට පටහැනිව දිස්ත්‍රික් වාරිමාර්ග කාර්යාලය පවත්වාගෙන යාමට පෞද්ගලික නිවාස කුලී ගෙවා තිබුණි. |

## 2.2.8 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් සභාව රු.109,576,949 ක් ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර තිබුණු අතර මේ සඳහා මුදල් කොමිෂන් සභාවේ අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

## 3. ආදායම් කළමනාකරණය

2008 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා බදු ආදායම සහ බදු නොවන ආදායම පහත පරිදි විය.

| වර්ෂය | බදු ආදායම<br>රු. | බදු නොවන ආදායම<br>රු. |
|---|---|---|
| 2008 | 2,129,385,380 | 581,339,602 |
| 2009 | 2,105,002,274 | 508,864,837 |
| 2010 | 2,532,157,291 | 520,489,536 |
| 2011 | 3,704,705,988 | 569,924,269 |
| 2012 | 3,287,589,262 | 1,040,988,048 |
| 2013 | 3,218,062,610 | 1,157,466,949 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉදිරිපත් කරන ලද ආදායම් ගිණුම අනුව ආදායම් වර්ග 4 ක වර්ෂ 01 සිට වර්ෂ 21 ක් අතර කාල පරාසයකට අදාල එකතුව රු.473,906,734 ක් වූ ආදායම් හිඟහිට තිබුණි.

(ii) 2013 දෙසැම්බර් 31 දිනට අයනොවී හිගහිටිව පැවති පිරිවැටුම් බදු ශේෂය රු.70,297,047 ක්වූ අතර එම හිඟ ආදායම අහිමිවීමේ අවිනිශ්චිතතාවයක් නිරීක්ෂණය විය.

(iii) පළාත් සභාවට අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක් විසින් එකතු කරනු ලබන අදාල හිඟ බදු වශයෙන් එකතුව රු.11,437,209 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

## 4. මූල්‍ය සමාලෝචනය

### 4.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු.130,858,734ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.477,243,879 ක් විය.

### 4.2 ව්‍යුහාත්මක මූල්‍ය සමාලෝචනය

| විෂයය | 2013 | 2012 | මූල්‍ය ප්‍රතිඵලය වැඩි වීම/(අඩු වීම) | |
|---|---|---|---|---|
| | (රු.000) | (රු.000) | (රු.000) | % |
| ආදායම | 4,755,429 | 4,508,779 | 246,650 | 5 |
| වියදම | (19,458,243) | (18,030,535) | (1,427,708) | 8 |
| ඌනතාවය | (14,702,814) | (13,521,756) | (1,181,058) | 9 |
| රජයේ ප්‍රදාන | 14,833,673 | 13,044,512 | 1,789,161 | 14 |
| රජයේ ප්‍රදාන වලින් පසු අතිරික්තය/(ඌනතාවය) | 130,859 | (477,244) | 608,103 | 127 |

### 4.3 ආයතනයට එරෙහිව ආරම්භකර තිබූ නෛතික සිද්ධි

2011 මැයි 29 හෝ ආසන්න දිනයකදී පළාත් සභාවට අයත් කැබ් රථයක් යතුරු පැදිකරුවෙකු සමඟ ගැටී අනතුරට පත්වී තිබුණද කැබ් රථයේ රියදුරු සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග විගණනයට අනාවරණය නොවීය.අනතුරට පත් යතුරුපැදිකරුට සිදුව ඇති හානිය ලෙස රු.5,000,000 ක වන්දි ඉල්ලා ගාල්ල දිසා අධිකරණයේ නඩු අංක M/8663 යටතේ නඩු පවරා තිබුණි. ඒ අනුව පළාත් සභාව රු.5,000,000 ක වගකීමකට යටත්කර තිබෙන බව විගණනයේදී නිරීක්ෂණය විය. රක්ෂණයෙන් වන්දි අයකර ගැනීමට කටයුතු කළ බවට සාක්ෂි නොවූ අතර ඊට හේතු අනාවරණය නොවීය.

## 5. වානිජ අත්තිකාරම් ගිණුම්

වාණිජ අත්තිකාරම් ගිණුම් 10 ක මූල්‍ය ප්‍රතිඵල පහත පරිදි විය.

| විෂය අංකය | අත්තිකාරම් ගිණුම් කටයුත්ත | මූල්‍ය ප්‍රතිඵල | | | |
|---|---|---|---|---|---|
| | | 2013 | | 2012 | |
| | | ලාභය කල්පිත ගාස්තු රහිතව | ලාභය කල්පිත ගාස්තු සහිතව | ලාභය කල්පිත ගාස්තු රහිතව | ලාභය කල්පිත ගාස්තු සහිතව |
| | | රු. | රු. | රු. | රු. |
| 30602 | ඉදිකිරීම් ද්‍රව්‍ය තත්ත්ව පරීක්ෂණාගාරය | 18,317,737 | 15,718,512 | 9,469,154 | 6,889,649 |
| 30702 | ආයුර්වේද ඖෂධ නිෂ්පාදන අත්තිකාරම් ගිණුම | 9,471,884 | 1,815,604 | 7,625,882 | 950,341 |
| 31402 | බීජ හා වගා ද්‍රව්‍ය අත්තිකාරම් ගිණුම | 5,667 | - | 21,883 | - |
| 31403 | ලබුදූව ගොවිපල අත්තිකාරම් ගිණුම | 6,360,920 | (11,941,953) | 4,581,273 | (13,721,418) |
| 31404 | පෝද්දිවෙල ගොවිපල අත්තිකාරම් ගිණුම | (655,023) | (6,911,140 ) | (90,805) | (5,169,68 |
| 31405 | තෙලිජ්ජවිල ගොවිපල අත්තිකාරම් ගිණුම | 492,032 | (11,168,888) | 153,068 | 5,318,371 |
| 31602 | කැකණදුර කුකුළු ගොවිපල පවත්වාගෙන යාම | 1,746,285 | (7,944,086) | 299,758 | (5,418,985) |
| 31603 | සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථානය | 172,564 | (655,645) | 505,230 | 53,329 |
| 32148 | වක්වැල්ල කළමනාකරණ සංවර්ධන පුහුණු ආයතනය | 2,298,195 | (1,932,133) | 943,063 | (1,810,984) |
| 32149 | බෝගහ පැලැස්ස නිවාඩු නිකේතනය හා පුහුණු මධ්‍යස්ථානය | (407,084) | (547,969) | (1,232,857) | (1,598,060) |

(අ) 2013 වර්ෂය සඳහා වූ අත්තිකාරම් ගිණුම් 02 ක් සම්බන්ධයෙන් විගණන මතයක් ප්‍රකාශ කළ නොහැකිවූ අතර, ඉකුත් වර්ෂ සම්බන්ධයෙන්ද ගිණුම් 02 ක් අරඹයා එපරිදි විගණන මතයක් ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) ලබුදූව ගොවිපල අත්තිකාරම් ගිණුමට අදාලව විගණනය සඳහා සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා රු.21,667,550 ක් වූ වත්කම් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 6. මෙහෙයුම් සමාලෝචනය

### 6.1 කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) වාර්ෂික කාර්ය සාධන වාර්තාව මගින් 2013 වර්ෂයේ ප්‍රධාන ලේකම් කාර්යාලය ඇතුළුව දකුණු පළාත් ශීර්ෂ 25 හි මූල්‍ය ප්‍රගතිය හා අයවැය ඇස්තමේන්තුව හා සත්‍ය වියදම / ආදායම අතර විචලතාවය ගණනය කර දක්වා තිබුණද රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PF/R/2/2/3/5(4) හා 2010 මාර්තු 10 දිනැති ලිපිය ප්‍රකාරව ප්‍රධාන ලේකම් කාර්යාලය වාර්ෂික කාර්ය සාධන වාර්තාව විධිමත්ව සකස්කර නොතිබුණි.

(ආ) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ 2013 වර්ෂයේ නව වැඩ සඳහා රු.656,963,166 ක් වෙන්කර තිබුණද 2013 වර්ෂයේ භාවිතා කර තිබුණේ රු.127,097,087 ක් හෙවත් සියයට 19 ක් පමණක් වන අතර ව්‍යාපෘති 693 ක් අනුමත කර තිබුණත් වැඩ අවසන් කර තිබුණේ ඉන් 405 ක් හෙවත් සියයට 58 ක් පමණි.

(ඇ) 2012 වර්ෂයේ පළාත් නිශ්චිත අවිච්ඡේද ව්‍යාපෘති 590 ක් සඳහා රු.728,952,400 ක ප්‍රතිපාදන අනුමතවී තිබුණද ඉන් 2013 වර්ෂයේදී වැයකර තිබුණේ රු.273,119,374 ක් හෙවත් සියයට 37 ක් පමණක් වන අතර අවසන් කර තිබුණ ව්‍යාපෘති සංඛ්‍යාව 517 ක් පමණි.

(ඈ) උපමාන පාදක ප්‍රදාන යටතේ 2013 වර්ෂයේ නව වැඩ සඳහා රු.187,382,560 ක් වෙන්කර තිබුණද 2013 වර්ෂයේ භාවිතා කර තිබුණේ රු.73,647,921 ක් හෙවත් සියයට39 ක් පමණක් වන අතර සැලසුම්කළ ව්‍යාපෘති 297 න් වැඩ අවසන් කර තිබුණේ ව්‍යාපෘති 181 ක පමණි.

(ඉ) 2012 වර්ෂයේ උපමාන පාදක අවිච්ඡේද ව්‍යාපෘති 66 කින් 2013 වර්ෂයේදී ව්‍යාපෘති 54 ක වැඩ නිමකර තිබු අතර මෙසේ අනුමත ව්‍යාපෘති සංඛ්‍යාවෙන් සියයට 82 ක වැඩ අවසන් කිරීම සඳහා රු.45,787,648 ක්වු අනුමත ප්‍රතිපාදනය ඉක්මවා රු.4,873,070 ක් වැය කර තිබුණි.

(ඊ) උඩුගම කලාපයේ පාසැල් 16 ක 2012 හා 2013 වර්ෂ වල එකදු ශිෂ්‍යයකුවත් ශිෂ්‍යත්ව විභාගය සමත් වි නොතිබු නමුත් එම වර්ෂවල පිළිවෙලින් රු. 71,914 ක් හා රු. 239,641 ක් ශිෂ්‍යත්ව විභාග ප්‍රතිඵල ඉහල නැංවීම සඳහා වැයකර තිබුණි. කලාපයේ පාසැල් දෙකක පමණක් උසස් පෙළ ජීව විද්‍යාව හා ගණිතය විෂය ධාරාවන් තිබු අතර 2011 හා 2012 වර්ෂවල කිසිදු ශිෂ්‍යයකු විභාගය සමත් වී නොතිබුණි.

(උ) ඇල්පිටිය කලාපයේ ශිෂ්‍යත්ව විභාගය පැවති මුළු පාසැල් 112 න් පාසැල් 62 ක කිසිදු ශිෂ්‍යයකු ශිෂ්‍යත්ව විභාගය සමත් වී නොතිබුණු අතර, එය සමස්ථයෙන් සියයට 55 කි.

## 6.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රධාන ලේකම් කාර්යාලය

දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) යටතේ ක්‍රියාත්මක වන රාජ්‍ය සේවයේ විමර්ශන හා විනය කටයුතු සම්බන්ධ ලිපිගොනු පරික්ෂාවේදී විනය විරෝධී ක්‍රියා හා සිද්ධි 25 ක් සම්බන්ධයෙන් 2013 නොවැම්බර් 14 දිනය දක්වා පරික්ෂණ අවසන් කර නොතිබුණු බව අනාවරණය විය.

(ආ) නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(සැලසුම්) කාර්යාලය

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) කාර්යාලය සතු හම්බන්තොට සංචාරක බංගලාව සඳහා සමාලෝචිත වර්ෂයේ රු.669,634 ක් වියදම් ලෙස දරා තිබුණත් මෙම බංගලාව භාවිතා කර තිබුණේ අවස්ථා 03 කදී දින 05 ක් පමණක් වන අතර දින 360 ක්ම කිසිදු කාර්යයක් සඳහා භාවිතා කර නොතිබුණි. එසේ තිබියදී සංචාරක බංගලාව සඳහා පෞද්ගලික ආරක්ෂක සේවයක සේවාව ලබාගන්නා අතරම නවාතැන් කරුවන්ද නොසිටියදී බංගලා භාරකරු සඳහා මාසිකව අතිකාල පැය 100 බැගින් ලබාදී 2013 වර්ෂයේ පමණක් අතිකාල දීමනා ලෙස රු.70,959 ක් ගෙවා තිබුණි. 2013 නොවැම්බර් 31 දිනට පෙර මෙම සංචාරක නිවාසය දිස්ත්‍රික් ලේකම්වරයාට විධිමත්ව භාරදෙන ලෙස දන්වා තිබුණද, එසේ නොකර භාණ්ඩවල ආරක්ෂාව සඳහා නවාතැන් භාරකරුට වැටුප් , ආරක්ෂක සේවා වියදම් හා ජලය , විදුලිය වියදම් දරමින් තවදුරටත් පවත්වාගෙන ගොස් තිබුණි.

(ඇ) දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

හික්කඩුව රජයේ රෝහල

(i) රෝහලේ ඖෂධ ගබඩාවේතිබු Inj.Promethazine Hydrochloride u.s.p 25 mg ඖෂධයපරික්ෂා කිරීමේදි මෙම ඖෂධයේ මි.ග්‍රෑ. 25 කුප්පි 38 ක් තුල කුඩා වීදුරු කැබලි වැනි ද්‍රව්‍ය කොටස් තිබු බව නිරීක්ෂණය විය.

(ii) රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරී නිල නිවාසය සඳහා වෙනම ලිපිගොනුවක් පවත්වා නොතිබු අතර, රු.2,254,000 ක ඇස්තමේන්තුවක් මත නිල නිවසේ වහලය සහ විදුලි පද්ධතිය අළුත්වැඩියා කර තිබුණි. ඒ සඳහා රු.1,710,312 ක මුදලක් ගෙවීම් කිරීමෙන් පසු අළුත්වැඩියා කටයුතු අතරමග නතර කර තිබු අතර, 2013 වර්ෂයේ අවසානය දක්වාම පදිංචියට සුදුසු තත්ත්වයට සකස් කර නොතිබුණි.

බලපිටිය මූලික රෝහල

ශල්‍යාගාරයේ මධ්‍යම වායු සමීකරණ පද්ධතිය 2011 වර්ෂයේ සිට අක්‍රියව පවතින අතර මෙම ශල්‍යාගාරය බිත්ති වායු සමීකරණ යන්ත්‍ර 04 ක් යොදවා ගනිමින් පවත්වා ගෙන ගොස් තිබූ අතර එම යන්ත්‍රද වරින් වර ක්‍රියා විරහිතවී තිබුණි. රෝහලේ විශේෂඥ ශල්‍ය වෛද්‍යවරුන් විසින් ශල්‍යාගාරයේ ශල්‍ය කර්ම, බිත්ති වායු සමීකරණ යන්ත්‍ර යොදාගෙන සිදුකිරීමේදී සිදුවිය හැකි හානිදායක තත්ත්වය පිළිබඳව කලින් කලට වෛද්‍ය අධිකාරී වෙත වාර්තා කර තිබුණද, 2013 වර්ෂයේ අවසානය දක්වාම මධ්‍යම වායු සමීකරණ පද්ධතිය යථා තත්ත්වයට පත්කර නොතිබුණි.

(ඇ) ආයුර්වේද කොමසාරිස් දෙපාර්තමේන්තුවට අයත් ප්‍රාදේශිය තුලිත සංවර්ධන ව්‍යාපෘතිය යටතේ 2012 නොවැම්බර් 23 දින වැඩ ආරම්භකර 2013 පෙබරවාරි 21 දින වැඩ අවසන් කළයුතු ගොඩනැගිල්ල 2013 දෙසැම්බර් 31 දින දක්වාම වැඩ අවසන් කර භාරදී නොතිබීම මත ඔසුපැන් අලෙවි ප්‍රවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කිරිමට නොහැකිවී තිබුණි.

(ඉ) කැකණදුර ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවේ කරන ලද නියදි විගණන පරික්ෂාවේදී බාහිර ඖෂධ ගබඩාව තුල ඖෂධ වර්ග 11 ක් හා ප්‍රධාන ඖෂධ ගබඩාව තුල ඖෂධ වර්ග 09 ක් ලෙස එකතුව ඖෂධ වර්ග 20 ක් පමණ කල් ඉකුත්වී තිබුණි. මෙසේ කල් ඉකුත්වූ ජීරකද්‍යාරිෂ්ඨය 2014 මැයි 13 දින විගණන පරීක්ෂණ අවස්ථාව වන විට බාහිර ගබඩාවෙන් රෝගීන් සඳහා නිකුත් කරමින් පැවතුණ අතර, තවත් ඖෂධ වර්ග 03 ක කාලය ඉකුත් වන දිනයන් සඳහන් කර නොතිබුණි.

**(ඊ) දකුණු පළාත්අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**මුලටියන කලාපය**

(i) 2010 වර්ෂයේ සිට මුලටියන කලාප කාර්යාලයීය වෑන්රථයේ මයිලෝ මීටරය ක්‍රියා විරහිතව තිබූ අතර එය යථා තත්ත්වයට පත් කිරීමට කටයුතු කර නොතිබුණු අතර පාලනයක් නොමැතිව ඉන්ධන නිකුත් කිරීම හේතුවෙන් 2012 හා 2013 වර්ෂවලදී ඉන්ධන වියදම පිළිවෙලින් රු.319,466 ක් හා රු.386,093 ක් වී තිබුණි.

(ii) මුලටියන කලාප අධ්‍යාපන කාර්යාලයට සමාලෝචිත වර්ෂයේ මාස 06 කටත් පෙර සිට වෙනත් ස්ථාන වලින් මාරුවී පැමිණි ගුරුවරුන් 28 දෙනෙකුගේ පෞද්ගලික ලිපිගොනු ගෙන්වා ගැනීමෙන් තොරව වැටුප් ගෙවා තිබුණි.

(උ) සමුපකාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

(i) 2009 - 2013 කාලපරිච්ඡේදයේ දි සමුපකාර අරමුදලින් දකුණු පළාතේ සමුපකාර සමිති වෙත රු.44,050,100 ක ණය ලබා දී තිබුණි.මෙම ණයවලින් රු.34,765,543 ක් වූ ණය මුදල් ද ඊට අදාල පොලිය රු.9,434,407 ක් ද වශයෙන් එකතුව රු.44,199,950 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2008 මාර්තු 08 දිනැති අංක 01/2008 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛයේ ප්‍රතිපාදනයන්ට පටහැනිව ග්‍රාමීය බැංකු තැන්පතු , ස්ථාවර තැන්පතු හා ඉතිරි කිරීමේ තැන්පතු වශයෙන් සමුපකාර සංවර්ධන අරමුදලෙන් රු.84,415,701 ක් යොදවා තිබුණි.

(iii) 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ viii පරිච්ඡේදයේ 44 වගන්තියේ ප්‍රතිපාදනවලට අනුව ලියාපදිංචි කරනු ලැබූ සෑම සමිතියකම ගිණුම් විගණනය, සමුපකාර රෙජිස්ට්‍රාර්වරයා විසින් බලය පවරනු ලැබූ තැනැත්තෙකු ලවා වාර්ෂිකව සිදු කළයුතු වුවත් විගණිත දිනය වූ 2013 ඔක්තෝබර් 01 දින වන විට ගාල්ල දිස්ත්‍රික්කයේ ගිණුම් 324 ක් ද, මාතර දිස්ත්‍රික්කයේ ගිණුම් 543 ක්ද, හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගිණුම් 1,619 ක් ද විගණනයසඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(iv) දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයෙහි සමුපකාර සමිති 263 ක්ද, මාතර දිස්ත්‍රික්කයේ සමිති 35 ක්ද හම්බන්තොට දිස්ත්‍රික්කයේ සමිති 249ක් ද වර්ෂ ගණනාවක සිට අක්‍රීය තත්ත්වයේ පැවති අතර එම සමිති සක්‍රීය සමිති බවට පත් කිරිමට අවශ්‍ය කිසිදු ක්‍රියාමාර්ගයක් විගණිත දිනය වූ 2013 ඔක්තෝබර් 01 දින වන විටත් ගෙන නොතිබුණි.

(v) 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 61 වැනි වගන්තිය යටතේ විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යවරයා විසින් පනවනු ලැබ 1973 නොවැම්බර් 20 දින ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරන ලද අංක 93/5 හා 1974 ජනවාරි 10 දිනැති ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද සමුපකාර සමිති රීති මාලාවේ 43(1) රිති ප්‍රතිපාදන අනුව සමුපකාර අරමුදලින් වැය කළ හැකි අරමුණුවලට පරිභාහිර වූ කාර්යයන් වෙනුවෙන් වර්ෂ 05 කදී එකතුව රු.1,057,308 මුදලක වැයකර තිබුණි.

(ඍ) සමාජ සේවා දෙපාර්තමේන්තුව
-----------------------------------

2013 වසරට මහජන රෝගාධාර ගෙවීම් සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 6 කට වෙන්කළ ප්‍රතිපාදනය රු.21,700,000 ක් වූ අතර 2013 ඔක්තෝබර් 31 දිනට ඉන් රු.7,357,250 ක් ඉතිරිව තිබුණි. සමාජසේවා අමාත්‍යාංශයේ 2012 මැයි 31 දිනැති අංක 02/201 දරන චක්‍රලේඛය ප්‍රකාරව මහජනාධාරලාභීන්, ආධාරලාභීන්ගේ ලේඛනයෙන් ඉවත් වන විට ජනතාව දැනුවත් කර ඊට සාපේක්ෂව අලුතින් ආධාරලාභීන් එක්කර ගැනීම සිදුවිය යුතු වුවත්, ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(එ) යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
-----------------------------------------------

යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ පිහිටුවා ඇති ග්‍රාම සංවර්ධන සමිති 03 ක් සඳහා දෙනලද රු.695,000 ක ගැමිසෙත ණය මුදලින් 2013 නොවැම්බර් මාසය වන විට රු. 135,918 ක මුදලක් අයකර ගෙන නොතිබුණි.

(ඒ) බලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
-------------------------------------------

බලපිටිය ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේග්‍රාම සංවර්ධන සමිති 03 ක් සඳහා දෙන ලද රු.950,000 ක ණය මුදලින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. 280,000 ක ශේෂයක් හිඟව පැවතුණි.

(ඔ) දකුණු පළාත් සංවර්ධන අධිකාරිය
---

(i) දකුණු පළාත් සංවර්ධන අධිකාරිය යටතට පවරා ගෙන ඇති මාතර ව්‍යවසායකත්ව හා සේවා මධ්‍යස්ථානය සතු රු. 6,886,652 ක මුදලක් මාතර කඹුරුගමුව රුහුණු සංවර්ධන බැංකු ගිණුමක සියයට 7.5 ක පොලී අනුපාතිකයක් යටතේ සුරක්ෂිතයක් ලෙස තැන්පත් කර තිබුණු අතර එය උපයෝගී කර ගෙන මාතර, ගාල්ල, හම්බන්තොට යන දිස්ත්‍රික්කවල කුඩා හා මධ්‍ය පරිමාන ව්‍යවසායකයන්ගේ ව්‍යාපාර වර්ධනයට හා ස්වයං රැකියා වර්ධනයට සියයට 12 ක පොලී අනුපාතිකයක් යටතේ රු.50,000 ක උපරිමයකට යටත්ව 2003 වර්ෂයේ සිට ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබුණි. ණය යෝජනා ක්‍රමය සඳහා රුහුණු සංවර්ධන බැංකුව හා අධිකාරිය වසර තුනෙන් තුන අළුත්කළ යුතු ගිවිසුමකට එළඹ තිබුණි. 2003 සිට 2014 දක්වා ණය ලාභින් 415 ක් වෙත රු. 18,383,000 ක ණය මුදල් ලබා දී තිබුණි.2008 ඔක්තෝබර් 06 දිනෙන් පසු ගිවිසුම් අළුත්කර නොතිබුණි. වසර 03 අවසානයේ ප්‍රදානිත ණය මුදල්වල ශේෂයත් පොලිය හා අනෙකුත් ගාස්තු වලට සමාන මුදලක් බැංකුවේ තැන්පත් කර ඇති මුදලින් අයකර ගැනීමට ගිවිසුමේ ඡේද අංක 16.8 යටතේ බැංකුවට බලය පවරා තිබුණු අතරපොලිය සමඟ ණය වාරික නිසි පරිදි අය නොවීම මත සුරක්ෂිත මුදල පිළිබඳ අනාගත අවදානමක් මතු වී තිබුණි.

(ii) දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශ විශේෂ ප්‍රතිපාදන මත මන්ත්‍රීවරයෙකුට කාර්යයන් 07 ක් වෙනුවෙන් රු.1,000,000 බැගින්මන්ත්‍රීවරුන් 38 ක් සඳහා රු.38,000,000 ක මුදලක් දකුණු පළාත් සංවර්ධන අධිකාරිය හරහා ලබා දී තිබුණි. මන්ත්‍රීවරුන් ඉදිරිපත් කළ ලැයිස්තුවල සඳහන් නම් වලට චෙක්පත් ලියා තිබු අතර ආධාර ලබා දීමට සුදුසු බව ප්‍රාදේශීය ලේකම් හෝ ග්‍රාම නිලධාරි නිර්දේශයක් ලබා දී නොතිබුණි.

(iii) මන්ත්‍රීවරයෙකුට රු.400,000 ක් බැගින් මන්ත්‍රීවරු 38 සඳහා රු.15,200,000 ක ප්ලාස්ටික් පුටු මිළදී ගැනීමට ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර, මිළ කැඳවීමකින් තොරව 2014 ජනවාරි මස රු.14,997,748 ක් වටිනා ප්ලාස්ටික් පුටු, පිලියන්දල ආයතනයක් වෙතින් මිළදී ගෙන තිබුණි. අදාල පුටු ලේඛනගත කිරීමකින් තොරව සෘජුවම මන්ත්‍රීවරුන් වෙත බෙදා හැර තිබුණු අතර දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන තීරණ ගැනීමේ සීමාවන් කුමක්ද යන්න විගණනයට අනාවරණය නොවීය.

(iv) 2014 ජනවාරි 12 දකුණු පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසුව මැතිවරණ කොමසාරිස්ගේ අංකPCE/2014/03 හා 2014 ජනවාරි 16 දිනැති චක්‍රලේඛයට පටහැනිව දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ 2012/2013 මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ වු රු.11,392,885 ක මුදලක් විවිධ කාර්යයන් සඳහා 2014 මාර්තු 07 දක්වා වැය කර තිබුණි.

(ඕ) දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් වසර ගණනාවක සිට අයකර නොගන්නා ලද කඩ කාමර කුලී ආදායම රු.3,504,812 ක් විය.

## 6.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

ගොවිපල සතුන් පිළිබඳ නිසි අධීක්ෂණයක් සිදු නොවීම නිසා 2013 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් 31 දින දක්වා කැකුණදූර සත්ව ගොවිපලේ රඳවා සිටි බ්‍රොයිලර් පැටව් 8495 කින් වටිනාකම රු.827,800 ක්වූ පැටව් 4139 ක් මියගොස් තිබුණි.

(ආ) ප්‍රධාන ලේකම් කාර්යාලයදක්ෂිණ සංවර්ධන අධිකාරියට නිකුත් කළ රු.5,614,080කණය ශේෂයක් 2013 දෙසැම්බර් 31 දින දක්වාම අයකර ගෙන නොතිබුණි.

(ඇ) 2009 සැප්තැම්බර් 09 දින භාණ්ඩාගාර අරමුදල මගින් දකුණු පළාත් සමුපකාර අරමුදල වෙත පවරා දී තිබු ණයවලින් 2013 සැප්තැම්බර් 30 දින වන විට ණය මුදල් රු.31,294,711 ක්ද එයට අදාල හිඟ පොලිය රු.15,339,462 ක් ද වශයෙන් රු.46,634,173 ක මුදල් අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 6.4 පළාත් මාර්ග සංවර්ධනය හා වැඩිදියුණු කිරීම

විගණනයේදී නිරික්ෂණයවු කරුණු පහත දැක්වේ.

(අ) 2013 දකුණු පළාත් සංවර්ධන සැලැස්ම යටතේ වතු ආශ්‍රිත මාර්ග සංවර්ධනය සඳහා රුපියල් මිලියන 14 ක් වෙන්කර තිබුණි. මෙම අරමුදල් මගින් සංවර්ධනය කිරීමට ගාල්ල දිස්ත්‍රික්කයේ මාර්ග 02 ක්ද , මාතර දිස්ත්‍රික්කයේ මාර්ග 07 ක්ද ලෙස මාර්ග 09 ක් තෝරාගෙන තිබුණි. ගිවිසුම් අනුව 2013 දෙසැම්බර් අවසානය වන විට මෙම මාර්ග වල ඉදිකිරීම් අවසන් කළයුතු වුවත් මාර්ග 07 ක වැඩ 2013 වර්ෂයේ අවසන් කර නොතිබුණි.

(ආ) මාදම්පේ , සුදුවැලිකඩ , දේවගොඩ මාර්ගය කි.මී. 0.000 - කි.මී.1.70 වැඩි දියුණු කිරීමේ කර්මාන්තය රු.475,735,407 ක ඇස්තමේන්තුවකට නිම කිරීම සඳහා පුද්ගලික ආයතනයක් වෙත පවරා තිබු අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.1 (අ) පරිදි ඉහත කර්මාන්තය සම්බන්ධයෙන් ලංසු ලබාගෙන නොතිබුණි.

## 6.5 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

පළාත් සභාවේ ආයතන විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි නිරීක්ෂණ වලදී අනාවරණයවු එවැනි ගනුදෙනු කීපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) දකුණු පළාත් සභාමුදල් රීති 85 හි ප්‍රතිපාදනයන්ට පටහැනිව 2013 දෙසැම්බර් 30 දින ආණ්ඩුකාර ලේකම් කාර්යාලය සඳහා 60 KVA ඩීසල් ජෙනරේටරයක් මිළදී ගැනීමට රු.2,351,866 ක චෙක්පතක් ලියා තිබුණි. මෙම ජෙනරේටරය විගණිත දිනය වූ 2014 මාර්තු 21 දින වනවිටද කාර්යාලය වෙත සපයා නොතිබුණද සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස සලකා කාර්යාලීය බඩු වට්ටෝරු පොතෙහි භාණ්ඩ ලැබී ඇති පරිදි සටහන් කර තිබුණි. එසේම 2013 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවෙන්ද මෙම ජෙනරේටරය භෞතිකව පැවති බවට සනාථ කර තිබුණි.

(ආ) දකුණු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් B T U - 24000 වායු සමීකරණ යන්ත්‍ර මිළදී ගැනීම සඳහා ආයතන 03 කින්මිල ගණන් කැඳවා තිබුණි. අඩුම මිළ ගණන් ඉදිරිපත් කර තිබුණු ආයතනයේ මිළ ගනන් නොසලකා අදාල ක්ෂේත්‍රයෙහි විශේෂඥ දැනුම ඇති පුද්ගලයෙකු ඇතුළත් නොවූ ප්‍රසම්පාදන කමිටුවක් විසින් අදාල කරුණු පදනම්ව ඉදිරිපත් කර තිබූ මිළ ගණන් අතුරින් වැඩිම මිළ ගණන් ඉදිරිපත් කර තිබූ ආයතනයෙන් මිළදී ගෙන තිබීම නිසා B T U - 24000 වායු සමීකරණ යන්ත්‍ර 04 ක් මිලදී ගැනීමේදී රු.74,732 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් 2013 අවසාන වාර ප්‍රශ්න පත්‍ර මුද්‍රණය සඳහා ගිවිසුම්ගත මුදල ඉක්මවා රු.2,347,670 ක මුදලක් මුද්‍රණ ආයතනයක් වෙත ගෙවා තිබුණි.එමෙන්ම ජයසංඛ ශිෂ්‍යත්ව වැඩ සටහන සඳහා ප්‍රශ්න පත්‍ර මුද්‍රණයට අදාලව පුද්ගලික සමාගමක් සමඟ ගිවිසුමක් අත්සන් නොකර රු.1,083,600 ක ගෙවීම් කර තිබුණි.

(ඈ) අධ්‍යාපන අමාත්‍යාංශය මගින් දකුණු පළාතේ අධ්‍යාපන ප්‍රතිඵල සංවර්ධන සඳහා දායක වූ ගුරුභවතුන් , විදුහල්පතිවරුන් විෂය අධ්‍යක්ෂවරුන් කොට්ඨාශ/ කලාප අධ්‍යක්ෂවරුන්, සම්පත් දායකයින් සහ අ.පො.ස.(උ.පෙ.) විභාගයෙන් අංශ හතරෙන්ම දිස්ත්‍රික්කයේ ප්‍රථමයන් වූ සිසුන් 12 ක්ද ඇතුළුව 150 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් මැලේසියා හා සිංගප්පූරු රටවල අධ්‍යාපන චාරිකාවක් සඳහා යැවීමටරු.36,178,328 ක මුදලක් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගුණාත්මක යෙදවුම් ප්‍රතිපාදන මුදල් වලින් ලබාගෙන වැය කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2014 ජනවාරි 16 සිට ජනවාරි 22 දින දක්වා මෙම වැඩ සටහන යටතේ පළමු කණ්ඩායම වශයෙන් 75 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සහභාගී වී තිබුණද එම සංචාරයට දිවයිනෙන් බැහැරවීම සඳහා අනුමැතිය ලබා දී නොමැති බව ජනාධිපති ලේකම් කාර්යාලය මගින් දැනුම් දී තිබුණි.

(ii) අදාල විදේශ සංචාරය සඳහා දෙවන කණ්ඩායම විදේශගත වීම නතර කර තිබුණද 2013 දෙසැම්බර් 31 දිනැති වවුචර් අංක 790 මගින් රු.7,875,000 ක මුදලක් ගුවන් ටිකට්පත් සඳහා අදාල නියෝජිත ආයතනය වෙත ගෙවා තිබුණි. එම මුදල් නැවත අයකර ගෙන නොතිබුණි.

(iii) 75 දෙනෙකුගෙන් යුත් පළමු කණ්ඩායම සංචාරය නිමකර ආපසු පැමිණ තිබුණද එම නිලධාරින්ගේ නිවාඩු දකුණු පළාත් ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කර නොතිබුණි.

(ඉ) සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ අරමුණු වලටපටහැනිව සමුපකාර අමාත්‍යාංශයේ නිලධාරින් සහ බාහිර පුද්ගලයන් තායිලන්තය, ඉන්දියාව,ඊශ්‍රායල යන රටවල විදේශ සංචාර සඳහා 2000 වසරේ සිට 2013 සැප්තැම්බර් 25 දින දක්වා කාලය තුල රු.14,327,083 ක මුදලක් සමුපකාර අරමුදලින් වැය කර තිබුණි.

(ඊ) දකුණු පළාත් සංවර්ධන අධිකාරිය විසින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ හුංගම අක්කර 55 ක භූමි ප්‍රමානයක ආදර්ශ සමෝධාන ගොවිපලක් ඇති කර සත්ව අභිජනන මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ව්‍යාපෘති වාර්තාවක් පිළියෙල කර නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැළසුම් හා මෙහෙයුම්) කාර්යාලය මගින් මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත්කර අනුමැතිය ලබා ගෙන තිබුණි.මෙම ව්‍යාපෘතිය සඳහා 2008 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා රු.25,259,640 ක වියදමක් දරා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරික්ෂණයන් සිදු කෙරේ.

(i) අධිකාරියෙන් මුදල් අත්තිකාරම් ලබා ගෙන වංචා සිදුකර තිබූ අයෙකුට මෙම අක්කර 55 ක භූමිය ශුද්ධ කිරීම භාර දී තිබූ අතර ඔහුට රු. 4,522,430 ක මුදලක් ගෙවා තිබුණි. එම ගෙවීම් වල නිරවද්‍යතාවය සම්බන්ධයෙන් විගණනයට සෑහීමකට පත්විය නොහැකි විය.

(ii) 2014 ජුනි 27 ක්ෂේත්‍ර විගණන පරික්ෂණ දිනය වන විටද මෙම භූමිය කිසිඳු වගාවක් නොමැති නිසරු භූමියක් ලෙස පැවතුනි.

(iii) 2011 සිට 2013 වර්ෂය දක්වා මෙම භූමියේ පොල් පැල වගා කිරිම සඳහා රු.21,83,247 ක මුදලක් වැයකර තිබුනද විගණන පරික්ෂණ දිනය වන 2014 ජුනි 27 දිනය වනවිට සියළු පැල මැරි විනාශවි තිබුණි.

(iv) ගව පාලනය සඳහා අවශ්‍ය වූ ජලය සහ තෘණ වගාව කෙරෙහි අවධානය යොමු කිරීමකින් තොරව ගවගාල් ඉදිකිරිම් කටයුතු සිදුකර තිබුණු අතර විගණන දින විට ගවගාල් දෙකම අතහැර දමා තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය සඳහා දරන ලද රු. 25,259,640 ක වියදම නිෂ්ඵල වියදමක් බව විගණනයට නිරික්ෂණය විය.

(උ) දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් රු.2,000,000 ක ආයෝජනයක් දක්ෂිණ ප්‍රවාහන පුහුණු ආයතනය තුළ සිදුකර ඇතත් එම ආයතනය වර්තමානයේ වැසීගොස් ඇති බැවින් එම ආයෝජනය පිළිබඳ ගැටළුකාරී තත්ත්වයක් පැවතුණි.

(ඌ) රුහුණු සංචාරක කාර්යංශය මගින් දකුණු පළාතට පැමිණෙන දේශිය හා විදේශිය සංචාරකයන්ට සමුද්‍ර පුරාවිද්‍යාත්මක ස්ථාන නැරඹීමේ පහසුකම් ප්‍රවර්ධනය කිරීමේ අරමුණු ඇතිව 2011 වර්ෂයේදී ආරම්භ කරන ලද ව්‍යාපෘතියක් සඳහා 2014 ජුනි විගණන දිනය වන විට රු.6,120,099 ක වියදමක් දරා තිබුණි. මෙම ව්‍යාපෘතියේ වැඩකටයුතු 2011 වර්ෂයේදී ආරම්භ කළද විගණන දින වනවිටත් එහි මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. එසේම මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කර නොතිබියදීත් කිමිදුම් යාත්‍රාව සඳහා කොන්සන්වරයකු බඳවාගෙන 2014 ජනවාරි මස සිට මැයි මස දක්වා රු.125,000 ක වැටුපක් ගෙවා තිබුණි..

(එ) 2013 ජනවාරි 19 දිනැති අංක 1793 /25 දරන ගැසට් නිවේදනය මගින් සිදුවූ දූෂණ හා අක්‍රමිකතා වෙනුවෙන් වැරදිකරු බව ප්‍රකාශකර දකුණු පළාත් ගරු ප්‍රධාන අමාත්‍යවරයා විසින් ගාල්ල නගරාධිපතිවරයාගේ කටයුතු කිරීම අත්හිටුවීමට එරෙහිව නගරාධිපතිවරයා

විසින් දකුණු පළාත් බද මහාධිකරණයේ අංක SP/HC/WRIT/03/2013දරන නඩුව පවරා තිබුණි.මෙම නඩුවේ විත්තිකාර පාර්ශවය ලෙස දකුණු පළාත් ගරු ප්‍රධාන අමාත්‍යවරයා ප්‍රමුඛ විත්තිකරුවන් 15 දෙනෙකු නම්කර තිබුණි.මෙම නඩුවේ විත්තිකාර පාර්ශවය වෙනුවෙන් නීතිඥ ගාස්තු හා විශේෂ පරික්ෂණ මණ්ඩල ගාස්තු වශයෙන් 2013 වර්ෂයේදී රු.5,248,658 ක් දකුණු පළාත් සභා අරමුදලින් ගෙවා තිබුණි.

## 6.6 දෘෂ්‍ය අක්‍රමිකතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් මාතර දිස්ත්‍රික් ඉදිකිරීම් ද්‍රව්‍ය පරීක්ෂණාගාරයේ සේවය කිරීම වෙනුවෙන් පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාට, දිස්ත්‍රික් ඉංජිනේරුවරයාට හා ගාල්ල හා මාතර දිස්ත්‍රික් ඉදිකිරීම් ද්‍රව්‍ය පර්යේෂණාගාරවල, පරීක්ෂණාගාර තාක්ෂණ නිලධාරීන්ට, පරීක්ෂණාගාර සහකාරවරුන්ට, පරීක්ෂණාගාර උදව්කරුවන්ට, පරීක්ෂණාගාර රියදුරන්ට සහ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විෂය ලිපිකරුට 2012 වර්ෂයේ දිරි දීමනා ලෙස රු.179,583 ක් ද, 2013 වර්ෂයේ දිරි දීමනා ලෙස රු.200,000 ක් ද වශයෙන් එකතුව රු.379,583 ක් දකුණු පළාත් ආණ්ඩුකාරතුමියගේ අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.

**(ආ)** නිල වාහනයක් පාවිච්චි කිරීමේ හිමිකමක් නොමැතිව මුලටියන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා, කාර්යාලය සතු කැබ්රථය සහ වෑන් රථය දින 30 ක් පෞද්ගලික පරිහරණය සඳහා යොදාගෙන තිබුණි.

(ඇ) අම්බලන්ගොඩ කලාපයේ බලපිටිය ගුරු විදුහලේ පාසැල් කම්කරුවෙකු ව්‍යාජ උප්පැන්න සහතිකයක් මත 2008 වසරේ සිට වසර 05 ක් විශ්‍රාම ගත යුතු වයසට වඩා වැඩියෙන් සේවය කර වැටුප් ලෙස රු. 920,160 ක්ද, අදාල දීමනාවන් ද ලබා ගෙන තිබුණද , 2013 දෙසැම්බර් 11 දින වන විටත් අවශ්‍ය විනය ක්‍රියාමර්ග ගෙන අවසන් කර නොතිබුණි.

## 6.7 අරමුදල් ඌන උපයෝජනය

2013 වර්ෂයේ සංවර්ධන සැලැස්මට අදාලව පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන මගින් අනුමත කර තිබු රු.මි.14.35 ක් වටිනා සංවර්ධන ව්‍යාපෘතීන් 06 ක් වර්ෂය තුළ නිම නොකිරීම හේතුවෙන් අරමුදල් ඌන උපයෝජන මට්ටමේ තිබුණි.

## 6.8 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව ඇතුළු රෝහලකට සහ කලාප අධ්‍යාපන කාර්යාල දෙකකට අයත් වත්කම් වර්ග 25 කට අදාල උපකරණ ඒකක 476 ක් වසර 01 සිට 13 අතර කාලයක් තිස්සේ නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව තිබුණි.

(ආ) දකුණු පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුව යටතේ රු.291,840 ක් වටිනාකම වූ ස්ථාවර වත්කම් අයිතම 06 ක් හා වටිනාකම දක්වා නොතිබූ ස්ථාවර වත්කම් අයිතම 12 ක් මාතර ඉදිකිරීම් ද්‍රව්‍ය පරීක්ෂණාගාරයේ නිෂ්ක්‍රීයව පැවති බව 2014 මැයි 13 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

(ඇ) ගාල්ල දිස්ත්‍රික් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සතුව එක්ස්කැවේටර් යන්ත්‍ර 05 ක් වූ අතර ඉන් යන්ත්‍ර 03 ක් 2007 සිට 2013 දක්වා වර්ෂවල කිසිදු කාර්යයක යොදා නොතිබුණි. ඉතිරි යන්ත්‍ර දෙක පමණක් ඉතා කෙටි කාලයක් සේවයේ යොදවා තිබුණු අතර එම යන්ත්‍ර නඩත්තු කිරීම, අළුත්වැඩියා සහ යන්ත්‍ර ක්‍රියාකරුවන් වෙනුවෙන් 2013 වර්ෂය තුල රු.1,241,743 ක වියදමක් දරා තිබුණි. එමෙන්ම වසරකට ආසන්න කාලයක් පෞද්ගලික ආයතනයකට අළුත්වැඩියා සඳහා භාර දී තිබූ දෙපාර්තමේන්තුවේ කොබොල්කා යන්ත්‍රය වෙනුවෙන් අළුත්වැඩියා ගාස්තු ලෙස රු. 815,263 ක් දරා තිබුණද 2013 වර්ෂයේදී එය ක්‍රියාකර තිබුනේ යන්ත්‍ර පැය 87 ක් පමණි.

(ඈ) හ/සමනලගම ආදර්ශ විද්‍යාලය සඳහා 2009 වර්ෂයේදී අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක EKSP/SEMP ව්‍යාපෘතිය මගින් විද්‍යාලයේ ස්ථාපිත කර තිබූ පරිඝණක මධ්‍යස්ථානය වෙත ලැබී තිබූ පරිඝණක 09 ක් , අහල් 26 සිංගර් රූපවාහිණියක් හා Multimedia Projector 02 ක් නිෂ්ක්‍රීයව පැවතුණි.

## 6.9 ආර්ථික නොවූ ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් අරමුණුවලට පටහැනිව වෙසක් සුභපැතුම්පත්, ලිපිකවර, දක්ෂිණ ලිත හා කාල සටහන් මුද්‍රණය කිරීම සඳහා රු.6,363,000 ක් ආයතනයකට ගෙවා තිබුණි.

(ආ) මාතර දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ O & K එක්ස්කැවේටර් යන්ත්‍රය අළුත්වැඩියා කිරිම සඳහා 2007 අගෝස්තු 02 දින රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට භාරදී තිබූ අතර ඒ සඳහා රු.191,418 ක අත්තිකාරම් මුදලක් ද ගෙවා තිබුණි. ඊට වසර 5 කට ආසන්න කාලයකට පසු 2012 ජනවාරි 13 දින පුද්ගලික ආයතනයක් වෙත මෙම යන්ත්‍රය අළුත්වැඩියා සඳහා භාරදී තිබුණු අතර යන්ත්‍රය රැගෙන ඒම සඳහා රු.30,000 ක මුදලක්ද 2012 මාර්තු 02 දින ගෙවා තිබුණි. මේ පිළිබඳව භෞතික පරීක්ෂාවේදී එම ආයතනය පවසා සිටියේ අදාළ යන්ත්‍රය අළුත්වැඩියා කළ නොහැකි බවත් එය ආපසු ගෙනයන ලෙසත් දැන්වූ බවය. අදාළ යන්ත්‍රය ගෙන ඒමට කටයුතු කර නොතිබූ අතර 2007 අගෝස්තු 02 දින සිට දරනලද රු.221,418 ක මුදලද මේ නිසා නිෂ්ඵල වියදමක් වී තිබුණි.

(ඈ) දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියවිසින් 2011 සැප්තැම්බර් 04 දින පුවත් පතක අධිකාරියේ සභාපතිවරයා සම්බන්ධයෙන් පලවූ සිද්ධියක් මත රුපියල් මිලියන 30 ක වන්දි ඉල්ලා පවරා ඇති නඩුව වෙනුවෙන් අධිකාරිය විසින් 2013 වර්ෂය තුලදී නීතිඥ ගාස්තු වශයෙන් රු.280,200 ක් ගෙවා තිබුණි. මේ අතර අධිකාරිය විසින් මෙම නඩුව සමතයකට පත්කර ගැනීමට කැමැත්ත පලකර තිබූ අතර ඒ වෙනුවෙන් පුවත්පත් ආයතනය විසින් සමාව අයදීමට අමතරව මේ දක්වා නඩුව වෙනුවෙන් වැයවූ මුදල් අධිකාරියට ලබාගැනීමට තීරණය කර තිබුණද මේ දක්වා ඒ පිළිබඳව කටයුතු අවසන් කර නොතිබුණි.

(ඇ) දකුණු පළාත සඳහා භූගෝලීය සංචාරක තොරතුරු පද්ධතියක් සකස් කිරීම වෙනුවෙන් රුහුණු සංචාරක කාර්යාංශය සබරගමුව විශ්ව විද්‍යාලය සමඟ 2013 දෙසැම්බර් 23 දින රු.4,490,000 ක ගිවිසුමකට එළඹ තිබූ අතර, ඒ සඳහා මූලික අදියරේ ගෙවීමක් ලෙස 2013 දෙසැම්බර් 31 දිනරු.898,000 ක මුදලක් ගෙවා තිබුණි. එසේ වුවද 2014 ජුනි 08 සහ 09 දෙදින කන්නෙලියේදී ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රමුඛව පැවති අමාත්‍යාංශයීය ප්‍රගති සමාලෝචන රැස්වීමේදී මෙම ව්‍යාපෘතිය ඉතාසංකීර්ණ හා වියදම් අධික කාර්යයක් බැවින් තාවකාලිකව නතර කිරීමට තීරණයක් ගෙන ඇති අතර ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා දැනට දරා ඇති රු.898,000 ක මුදල නිෂ්ඵල වියදමක් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය.

## 6.10 හඳුනා ගන්නා ලද පාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1989 සිට 2013 දක්වා කාල පරාසය තුල දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් පාසැල් හා කලාප අධ්‍යාපන කාර්යාල වල අවස්ථා 111 කදි සිදුවී තිබූ හානි හා පාඩු වල වටිනාකම රු.4,034,996 ක් වූ අතර ඒවා සම්බන්ධයෙන් 2014 මාර්තු 10 විගණන දිනය දක්වාද සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව කටයුතු කරමින් කද්දුව කඹුරුපිටිය මාර්ගයේ අදාල කොටස සංවර්ධනය වෙනුවෙන් ඇස්පෝල්ට් මෙට්‍රික් ටොන් 1542 ක් ලබාගෙන තිබුණේ දකුණු පළාත් සභාව තුල 2012 වර්ෂයට අනුමත රේටය වන ඇස්පෝල්ට් මෙට්‍රික් ටොන් එකක මිල වන රු.11,520 අභිබවා වූ රු.12,540 ක් බැගින් නිසා පළාත් සභා අරමුදලට රු.1,603,680 ක පාඩුවක් සිදුවී තිබුණි.

## 6.11 ප්‍රමාද වූ ව්‍යාපෘති

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රුහුණු සංචාරක කාර්යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද රු.48,857,900 ක ඇස්තමේන්තුගත වටිනාකමක් ඇති සංවර්ධන ව්‍යාපෘති 2 ක් නිම කළයුතු ගිවිසුම් කාලය ඉක්මවා, මාස 03 ක සිට වසර 1 දක්වා කාලයක් ප්‍රමාදවී තිබුණි.

(ආ) දකුණු පළාත් සංවර්ධන අධිකාරිය විසින් දෙල්පෝන පානීය ජල ව්‍යාපෘතිය 2005 වර්ෂයේ ආරම්භ කර රු.2,765,343 ක් වැය කර සමාලෝචිත වර්ෂයේ අවසානයට ව්‍යාපෘතිය නිම නොකර අත්හැර දමා තිබුණි.

(ඇ) (i) දකුණු පළාත්සංවර්ධන අධිකාරිය විසින් රු.850,000 ක් වටිනා ව්‍යාපෘති 05 ක් 2013 වර්ෂයේ ක්‍රියාත්මක කර තිබූ අතර 2014 අගෝස්තු 13 දිනවන විටත් කිසිම ව්‍යාපෘතියක් අවසන් කර නොතිබුණි.

(ii) අධිකාරිය පවත්වා තිබූ ව්‍යාපෘති ප්‍රගති වාර්තා අනුවගාල්ල,මාතර,හම්බන්තොට දිස්ත්‍රික් වලට අදාල මුළු ව්‍යාපෘති ගණන 119 ක් වූ අතර වැඩ අවසන් හා සියයට 50 ක් වැඩ අවසන් වූ ව්‍යාපෘති ගණන 32 ක් විය. ව්‍යාපාති 87 ක් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම ක්‍රියාත්මක කර නොතිබුණි. තවද ඉහත ව්‍යාපෘති වලින් සියයට 27 ක් නිම කිරීම සඳහා මුළු ප්‍රතිපාදන මුදලින් සියයට 54 ක් වියදම් දරා තිබූ අතර, ඉතිරි සියයට 73 නිම කිරීමට ප්‍රතිපාදන මුදලින් ඉතිරිව තිබුනේ සියයට 46 ක් පමණි.

## 6.12 වෙනත් රාජ්‍ය ආයතනවලට ලබාදුන් සම්පත්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් සභාව සතු වාහන භාවිතා කිරීමට පළාත් සභා මන්ත්‍රීවරුන්ට හිමිකමක් නොතිබුණද ඉසුසු වර්ගයට අයත් කැබ්රථයක් 2013 මැයි 09 දින සිටද එම වර්ගයට අයත් තවත් කැබ් රථයක් 2012 නොවැම්බර් 23 දින සිටද පළාත් සභා මන්ත්‍රීවරුන් දෙදෙනෙක් සඳහා ලබාදීමට කටයුතු කර තිබූ අතර විගණිත දිනය වූ 2014 අගෝස්තු 22 තෙක් නැවත කැබ් රථ සභා ලේකම් කාර්යාලයට භාරදී නොතිබුණි. එම කාලය තුළ අලුත්වැඩියා කටයුතු, නඩත්තු සේවා සඳහා එක් කැබ්රථයක් වෙනුවෙන් රු.261,738 ක වියදම්දරා තිබුණද අනෙක් කැබ් රථය සම්බන්ධයෙන් අදාල නඩත්තු කිරීම,සේවා කිරීම, සහතික ලබාගැනීම පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

(ආ) දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියෙන් පරිබාහිර ආයතන සඳහා අනියම් සේවක මහතුන් සිව් දෙනෙකු විධිමත් අනුමැතියක් නොමැතිව සේවයේයොදවා 2012 ජනවාරි සිට 2014 මාර්තු දක්වාවූ කාලපරිච්ඡේදය සඳහාරු.1,669,704 ක වැටුප් ගෙවා තිබුණි.

## 6.13 කාර්යමණ්ඩලපරිපාලනය

**6.13.1** පහත සඳහන් පරිදි පළාත් සභාවේ ආයතන 03 ක තනතුරු ඌනතා හා අතිරික්තතා නිරීක්ෂණය විය.

| ආයතනය | ඌනතාවය | අතිරික්තය |
|---|---|---|
| ප්‍රධාන අමාත්‍යාංශය | 27 | 23 |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | 08 | - |
| රුහුණු සංචාරක කාර්යාංශය | 31 | 27 |

**6.13.2** (අ) අම්බලන්ගොඩ කලාපයේ ගුරුවරුන් 17 දෙනෙකු හා මුරකරුවන් දෙදෙනෙකු 2005 සිට 2013 දක්වා ලබා ගෙන තිබු වැටුප් රහිත නිවාඩු දින 3916 ක් වෙනුවෙන් රු. 1,391,016 ක් අයකර ගත යුතුව තිබුණි. ඉහත ගුරුවරුන් අතර එක් ගුරුවරයෙකු 1995 වර්ෂයේ එක් දිනක්වත් සේවය කර නොතිබු අතර, 1996 වර්ෂයේ වැඩ කර තිබු දින ගණන 02 ක් පමණක් වී තිබුණි. වැටුප් රහිත නිවාඩු ලබා තිබුණද, උසස්වීම් ලබාදීමේදී ඒ පිළිබඳ සැලකිලිමත් වී නොතිබුණි.

(ආ) **ඇල්පිටිය** කලාපයේ ගුරුවරු හයදෙනෙක් හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ දෙදෙනෙක් 1999 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වටිනාකම රු. 773,688 ක් වු වැටුප් රහිත නිවාඩු දින 1200 ක් ලබා ගෙන තිබුණු අතර පාසැල් කම්කරුවකුගේ දින 386 ½ ක වැටුප් රහිත නිවාඩුවලට අදාල රු.164,178 ක මුදලක් අයකර ගෙන නොතිබුණි.

(ඇ) දකුණු පළාත් පාසැලක සේවයේ නිරත වියයුතු සහකාර විදුහල්පතිවරයෙකු දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය මත විධිමත් අනුමැතියකින් තොරව ගා/රිච්මන්ඩ් විද්‍යාලයේ රාජකාරි කටයුතු සඳහා රඳවා ගෙන 2010 ජුලි සිට 2013 සැප්තැම්බර් දක්වා වැටුප් වශයෙන් රු. 997,435 ක් ගෙවා තිබුණි. 2011 මාර්තු 31 දිනෙන් පසුව මුදා හැරිය යුතු මෙම සහකාර විදුහල්පතිවරයා විධිමත් අවසරයකින් තොරව සහභාගි වු වැඩ මුළුවකට ගොස් ආපසු පැමිණීමේදී විද්‍යාලයට අයත් වෑන් රථයේ රියදුරු ලෙස කටයුතු කිරීමෙන් අනතුරකට භාජනයවී වැඩ තහනමකටද ලක්ව තිබුණි.

(ඈ) අම්බලන්ගොඩ කලාපයේ බලපිටිය ගුරු විදුහලේ විදුහල්පතිවරයා විශ්‍රාම ගැන්වීමේ බලය මධ්‍යම රජයේ අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් සතු වුවද , අම්බලන්ගොඩ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරිය විසින් එම නිලධාරියා විශ්‍රාම ගන්වා තිබුණි.

(ඉ) ඇල්පිටිය, අම්බලන්ගොඩ , උඩුගම යන කලාප අධ්‍යාපන කාර්යාලවලට අයත් ගුරු සේවයේ නිලධාරීන් 16 දෙනෙකු වෙනත් බාහිර ආයතන වලට මුදාහැර වසර 01 සිට වසර 29 ක කාලයක් තිස්සේ අදාල කලාප අධ්‍යාපන කාර්යාල යටතේ වැටුප් ගෙවා තිබුණි.

6.13.3 (අ) දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට සේවක පුරප්පාඩු 1358 ක් පිරවීමට අපොහොසත් වී තිබුණි

(ආ) පහත සඳහන් පරිදි දකුණු පළාත් සෞඛ්‍ය සේවයට අයත් ආයතන 03 ක තනතුරු ඌනතා හා අතිරික්තතා නිරික්ෂණය විය.

| ආයතනය | ඌනතාවය | අතිරික්තය |
|---|---|---|
| අපරැක්ක ආයුර්වේද රෝහල | 26 | 15 |
| වරල්ල ආයුර්වේද රෝහල | 08 | 09 |
| ගාල්ල දිසානායක ආයුර්වේද රෝහල | 17 | 10 |

(ඇ) ඇල්පිටිය මූලික රෝහලේ දන්ත වෛද්‍ය ඒකකයට දන්ත වෛද්‍යවරු තිදෙනෙක් අනුයුක්ත කර තිබුණත් දන්ත වෛද්‍ය ඒකකයේ අත්‍යාවශ්‍ය උපකරණ 03 ක් නොතිබීම හේතුවෙන්, මානව සම්පත් කාර්යක්ෂම ලෙස උපයෝගී කර නොගැනීමේ තත්ත්වයක් විගණනයේදී නිරීක්ෂණය විය.

## 6.14 වාහන උපයෝජනය

(අ) දකුණු පළාත් සභාව සඳහා රු.374,150,000 ක් වටිනාකමින් යුක්ත වූ ඩබල් කැබ් රථ 81 ක් හා මෝටර් කාර් රථ 19 ක් ඇතුළුව වාහන සියයක් මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ මිලදී ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදුකෙරේ.

(i) භාණ්ඩාගාර ලේකම්ගේ අංක BD/GPS/130/09/02 හා 2010 දෙසැම්බර් 07 දිනැති අයවැය චක්‍රලේඛයේ අංක 150 ට අනුව දකුණු පළාත් සභාව මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ වාහන 100 ක් මිලදී ගැනීමට භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන තිබුණේ අවුරුදු 10 ට වඩා පැරණි වාහන අපහරණය කිරීමේ කොන්දේසිය මත වුවත් 2013 දෙසැම්බර් 31 දින වන විටත් අපහරණය කර තිබුණේ අපහරණය කිරීමට යෝජිත වාහන 141 ක ලැයිස්තුවෙන් වාහන 112 ක් පමණි.

(ii) වෙන්දේසි කළ වාහන අතුරෙන් වාහන දෙකක් රු.2,476,500 කට මිලදී ගැනීමට ගැණුම්කරුවන් ඉදිරිපත්වී මුදල් ගෙවා අයිතිය මාරුකර ගැනිමට යාමේදී වාහනවල වැසි අංක අදාල වාහන නිෂ්පාදන සමාගම විසින් භාවිත කරන හැඩයට වඩා වෙනස් බැවින් ඇතිවී තිබූ ප්‍රශ්නකාරී තත්ත්වයන් යටතේ ගැනුම්කරුවන්ට එම මුදල් ආපසු ගෙවීමට සිදුවී තිබුණි. එසේ වුවත් එම වාහන සම්බන්ධ ගැටළු මතුවීමට තුඩුදී තිබූ කරුණු සම්බන්ධව වගකිව යුතු පුද්ගලයින් හඳුනාගෙන අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) භාණ්ඩාගාර ලේකම්වරයාගේ අංක BD/GPS/130/09/02 හා 2010 දෙසැම්බර් 07 දිනැති අයවැය චක්‍රලේඛ 150 විධිවිධාන අනුව 2013 වසරේදී මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ මිලදී ගත් වාහන 100 න් 2013 නොවැම්බර් 21 දින වන විට වාහන 15 ක් අනතුරුවලට ලක්වී තිබුණි. එම වාහන සඳහා පූර්ණ රථවාහන රක්ෂණය ලබාගෙන තිබියදි 2103 නොවැම්බර් 21 වන විට ඉහත අනතුරු වලට ලක්වූ වාහන අතුරින් රක්ෂණ වන්දි මුදල් ලබාගෙන තිබුණේ වාහන 03 ක් සඳහා පමණි. තවද අනතුරුවලට ලක්වී තිබූ කිසිදු වාහනයක් වෙනුවෙන් දකුණු පළාත් සභා

මුදල් රීති 54:1:3 ප්‍රකාරව පරීක්ෂණ පවත්වා වගකිව යුත්තන් නිශ්චය කර නොතිබුණු අතර වාහන 03 ක අනතුරු සම්බන්ධව කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(iv) මිලට ගත් වාහන 100 න් 7 ක් ප්‍රධාන අමාත්‍යාංශය වෙත ලබාදී තිබුණද අපහරණය සඳහා ඉදිරිපත් කර තිබුණේ වාහන එකක් පමණක් වන අතර අපහරණය කළයුතු පැරණි වාහන දෙකක් රඳවා තබා ගනිමින් 2013 වසරේදී රු.1,126,884 ක් වැයකර අළුත්වැඩියා කර තිබුණි.

(v) ප්‍රධාන ලේකම් කාර්යාලීය වාහන අපහරණයසම්බන්ධයෙන් වු තෙවන වාහන වෙන්දේසියේදී වාහන 23 ක වැසි අංක හා එන්ජින් අංක වල වු අපැහැදිලි තත්ත්වයන් නිසා මෝටර් රථ පරීක්ෂකවරයාගේ නිර්දේශය පරිදි අබිලි ලෙස වෙන්දේසි කිරීමට තීරණය කර තිබුණි. වාහන පරිහරණය කළ නිලධාරීන් මේ සම්බන්ධයෙන් වගකීමට බැඳෙන අතර ඒ සඳහා පරීක්ෂා කිරීමකින් තොරව අදාල බලධාරීන් විසින් වාහන අබිලි ලෙස විකිණීමට තීරණය කිරීම නිසා මීට පෙර පැවති වාහන වෙන්දේසි දෙකේදී ලබාගෙන තිබු ආදායමට සාපේක්ෂව පළාත් සභාවට ලැබිය හැකිව තිබු රු.22,671,968 ක්පමණමුදලක් අහිමිවීමක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) 2012 වර්ෂය තුල අධ්‍යාපන අමාත්‍යාංශය සතු වාහන 15 ක් වෙනුවෙන් ලීටර් 48,737 සඳහා රු.6,039,660 ක ඉන්ධන වියදමක් දරා තිබු අතර ඉන් රු. 3,615,978 ක් අමාත්‍යවරයා සහ පෞද්ගලික කාර්ය මණ්ඩලය භාවිතා කරන ලද වාහන 06 ක් වෙනුවෙන් දරා තිබුණි. 2013 වර්ෂයේදී වාහන 22 ක් වෙනුවෙන් රු. 7,857,188 ක් ඉන්ධන සඳහා වැයකර තිබු අතර ඉන් රු.4,038,459 ක් අමාත්‍යවරයා සහ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ වාහන 07 ක් වෙනුවෙන් දරා තිබුණි. තවද, ජනාධිපති ලේකම්ගේ අංක : PCMD/1/4/23/4/4 හා 2011 දෙසැම්බර් 19 දිනැති චක්‍රලේඛයට පටහැනිව, ඉන්ධන දීමනා ලබන අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරින් තිදෙනෙකු 2012 වර්ෂයට හිමි ඉන්ධන දීමනා වු රු.1,014,420 (ලීටර් 8112 ) කට අමතරව ඉන්ධන ඇණවුම් මගින්ද ඉන්ධන ලීටර් 10619 ක ප්‍රමාණයක් ලබාගෙන තිබුණි. 2013 වර්ෂයේදීද රු.1,074,169 ක ඉන්ධන දීමනා වලට අමතරව ඉන්ධන ඇණවුම් මගින් රු. 1,168,159 ක් වටිනා ඉන්ධන එම වාහන සඳහා භාවිත කර තිබුණි.

**6.15 බැංකු ගිණුම් හා බැංකු සැසඳුම්**

**(අ) අක්‍රීය බැංකු ගිණුම්**

දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලැබු බැංකු ජංගම ගිණුම් 02 ක් 2013 දෙසැම්බර් 31 දිනට මාස 06 සිට වසර 6 ක කාලයක් අක්‍රීයව තිබුණු අතර, ගිණුම්වලට අදාල බැංකු ශේෂය රු.90,720 ක් විය.

**(ආ) ගැලපුම් කළයුතු ශේෂ**

දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව හා අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් ආයතන විසින් 2013 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු

සැසැඳුම් ප්‍රකාශවල ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරනය වු තොරතුරු පහත දැක්වේ.

| ගැලපුම් පිළිබඳ විස්තරය | කාල විශ්ලේෂණය | | | |
|---|---|---|---|---|
| | මාස 6 ට වැඩි වර්ෂ 1 ට අඩු | වර්ෂ 1ට වැඩි වර්ෂ 3 ට අඩු | වර්ෂ 3ට වැඩි | එකතුව |
| | රු. | රු. | රු. | රු. |
| උපලබ්ධි නොවූ තැන්පතු | - | - | 3,089,560 | 3,089,560 |
| නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 1,592,804 | 24,000 | 2,680,953 | 4,297,757 |
| හඳුනානොගත් හර | 165,788 | - | - | 165,788 |
| හඳුනානොගත් බැර | 74,209 | - | - | 74,209 |
| | 1,832,801 | 24,000 | 5,770,513 | 7,627,314 |

## 07. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 7.1 ක්‍රියාකාරි සැලැස්ම

2010 මාර්තු 10 දිනැති අංක PF/R/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ 1.4.1 ඡේදය ප්‍රකාරව ක්‍රියාකාරි සැලැස්මක් 2013 දෙසැම්බර් 31 දින වනවිටත් ආයතන 05 ක් වෙනුවෙන් පිළියෙල කර නොතිබුණි.

### 7.2 අභ්‍යන්තර විගණනය

ආයතන 07 ක අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවා නොතිබුණි.

### 7.3 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

2013වර්ෂයේදී පළාත් පාලන දෙපාර්තමේන්තුව, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා දකුණු පළාත් සංවර්ධන අධිකාරිය යන ආයතන 3 හි විගණන හා කළමනාකරණ කමිටු රැස්වී නොතිබුණි.

### 7.4 ප්‍රසම්පාදන සැලැස්ම

පහත දැක්වෙන පළාත් සභාවේ ආයතන 6 ක් විසින් 2006 මාර්තු 29 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2013 වර්ෂයට අදාල වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

- ප්‍රධාන අමාත්‍යාංශය
- ආයුර්වේද දෙපාර්තමේන්තුව
- අධ්‍යාපන , ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහාමාර්ග, ප්‍රවෘත්ති සහ ග්‍රාමීය හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය
- සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
- දකුණු පළාත් සංවර්ධන අධිකාරිය
- නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) කාර්යාලය

## 7.5 අයවැය ලේඛනමය පාලනය

රුහුණු සංචාරක කාර්යාංශයේ 2013 වර්ෂයට අදාල අයවැයගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී තථ්‍ය ආදායම හා අයවැයගත ආදායම අතර සියයට 43 ක අහිතකර විචලනයක් පෙන්නුම් කර තිබූ අතර අයවැයගත පුනරාවර්තන වියදම ඉක්මවා තථ්‍ය වියදම සියයට 31 ක විචලනයක් විය.

## 7.6

| විස්තරය | අයවැයගත | තථ්‍ය | විචලනය | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන ආදායම | 13,569,373 | 7,703,668 | (5,865,705) | (43) |
| පුනරාවර්තන වියදම | 11,690,112 | 15,342,137 | 3,652,025 | 31 |

### පිළිතුරු නොලත් විගණන විමසුම්

2014 සැප්තැම්බර් 30 දින වන විට විගණන විමසුම් 77කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර, එකී විමසුම්වලට භාජනය වූ ගනුදෙනුවල ගණනය කළ හැකි වටිනාකම රු.162,150,423ක් විය. (විස්තර ඇමුණුම් අංක 2 හි දැක්වේ)

## 8. පද්ධති හා පාලනය

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර දකුණු පළාත් සභාවේ ආයතන ප්‍රධානීන් හා ප්‍රධාන ලේකම්වරයා දැනුවත් කරන ලදි. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් කළමනාකරණය

(ඇ) සේවක පරිපාලනය

(ඈ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඊ) වාහන උපයෝජනය

(උ) තොග පාලනය

ඇමුණුම් අංක - 1
ඡේදයට යොමුව:2.2.6

| ආයතනය | ගිණුම් විෂයය | වටිනාකම | නොසැපයූ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| සාහිත්‍ය හා කලා සංවර්ධන අරමුදල | භාණ්ඩ හා උපකරණ සැපයීම් | 2,130,217 | බිල්පත් හා කුවිතාන්සි |
| | ඉදිකිරීම් හා අළුත්වැඩියාවන් | 1,551,900 | අනුමත ඇස්තමේන්තුව , ගිවිසුම් , සතුටුදායක ලෙස නිමකල බවට සහතික |
| | ආධාර ගෙවීම් | 1,511,319 | ගෙවීම්ලාභීන්ගේ නාමලේඛනය හා ලබාගත් බවට අත්සන් |
| | උත්සව වියදම් | 3,327,890 | බිල්පත්, කුවිතාන්සි, වියදම් වාර්තා |
| | මුද්‍රණ වියදම් | 97,560 | බිල්පත්, කුවිතාන්සි |
| දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය | ජංගම නොවන වත්කම් | 11,821,432 | වත්කම් ලේඛනය හා උපලේඛන |
| දකුණු පළාත් රුහුණු සංචාරක කාර්යාංශය | ස්ථාවර වත්කම් | 197,313,377 | සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| | ගාලු පුරාණය පොත් තොගය | 1,021,500 | සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| | | 218,775,195 | |

ඇමුණුම් අංක -2
ඡේදයට යොමුව:7.6

පිළිතුරු නොලත් විගණන විමසුම්

| විමසුම් අංකය | දිනය | විස්තරය | වටිනාකම |
|---|---|---|---|
| | | | රු. |
| දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | | | |
| එස්එන්/ජීඑල්/බී/සෞ.සේ./බල. රෝ./2013/වි.27 | 2014.01.29 | මූල්‍ය විගණනය - බලපිටිය මූලික රෝහල- වාහන උපයෝජනය | 5,808,372 |
| එස්එන්/ජීඑල්/බී/සෞ.සේ./බල. රෝ./2013/වි.32 | - එම - | මයිලෝ මීටරය අක්‍රියව පැවතීම | - |
| එස්එන්/ජීඑල්/බී/සෞ.සේ./බල. රෝ./2013/වි.37 | 2014.02.20 | මූල්‍ය විගණනය - බලපිටිය මූලික රෝහල- අංක LW-0151 දරන ගිලන් රථය අනතුරට ලක්වීම සම්බන්ධ පරීක්ෂාව | 1,068,650 |
| එස්එන්/ජීඑල්/බී/සෞ.සේ./ඇල් .රෝ./2013/වි.40 | - එම - | ඇල්පිටිය මූලික රෝහල - ඖෂධ ගබඩාව පරීක්ෂාව | 283,781 |
| එස්එන්/ජීඑල්/බී/සෞ.සේ./ඇල් .රෝ./2013/වි.41 | - එම - | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම | - |
| එස්එන්/එම්ආර්ජී/2013/සෞ. සේ./මුවි/07 | 2013.06.21 | බැංකු සැසඳුම් පරීක්ෂාව | 16,355 |
| එස්එන්/එම්ආර්ජී/2012/සෞ. සේ./මුවි/04 | 2013.06.14 | බස් රථය ජංගම රසායනාගාරයක් ලෙස නවීකරණය කිරීම | 4,666,432 |
| එස්එන්/එම්ආර්ජී/2013/කඹු. රෝ./මුවි/08(ii) | 2013.09.23 | ප්‍රධාන ගබඩාව හා රෝහල් වාට්ටු පරීක්ෂාව | - |
| එස්එන්/එම්ආර්ජී/2013/කඹු. රෝ./මුවි/08(vii) | 2013.09.24 | රෝහල් සේවක මණ්ඩල තොරතුරු පිළිබඳ පරීක්ෂාව | - |
| එස්එන්/එම්ආර්ජී/2013/වැලි. රෝ./මුවි/09(v) | 2013.09.30 | රෝහල් භූමිය සම්බන්ධ පරීක්ෂාව | - |
| එස්එන්/එම්ආර්ජී/2013/සෞ. සේ./14 වි.(1) | 2014.01.27 | මූල්‍ය විගණනය 2012/2013 මිදිගම මධ්‍යම බෙහෙත් ශාලාව | 353,042 |
| එස්එන්/එම්ආර්ජී/2013/සෞ. සේ./13 වි.(2) | 2014.01.27 | මූල්‍ය විගණනය 2012/2013 දික්වැල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය | - |
| එස්එන්/එම්ආර්ජී/2013/සෞ. සේ./16 වි.(1) | 2014.01.27 | මූල්‍ය විගණනය 2012/2013 වැලිගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය | - |
| එස්එන්/එම්ආර්ජී/2013/සෞ. සේ./11 වි.(1) | 2014.01.27 | මූල්‍ය විගණනය 2012/2013 අකුරැස්ස සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය | 163,850 |
| එස්එන්/එච්එම්ජී/හ.දි./සෞ.සේ. /මු.වි./ප.ස./2013/ 17/වි.02 | 2014.01.31 | කාරියමඩිත්ත දිසා රෝහලේ රිය සහායක ඕ.ඒ.ධර්මසේන මයා වෙත අතිකාල දීමනා ලබාගැනීම | 190,784, |
| එස්එන්/එච්එම්ජී/හ.දි./සෞ.සේ. /මු.වි./ප.ස./2013/ 17/වි.01 | 2014.02.11 | අනුමැතියකින් තොරව අතිකාල දීමනා ලබාදීම 2012/2013 සෞඛ්‍ය කම්කරු ටී.එම්.අතුල මයා | 341,272 |
| එස්එන්/එච්එම්ජී/හ.දි./සෞ.සේ. /මු.වි./ප.ස./2013/ 17/වි.03 | 2014.03.05 | මු.වි. 2013/හම්බන්තොට දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | 7,016,092 |

| | | | |
|---|---|---|---|
| එස්එන්/එච්එම්ජ්/හ.දි./සෞ.සේ./ආ.කා./අත්.බී.ගි/2013/09 | 2014.04.10 | පළාතේ රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුම - 2013 විෂය අංක - 30504 | |
| එස්එන්/එච්එම්ජ්/සූ.රෝ./මු.වි./ප.ස./ 2013/03 (ජේද අංක 03(i),(ii),(iii),(iv),(v) සහ ජේද අංක 04 (i),(ii),(iii),(iv),(v),(vi)(vii) | 2013.09.13 | මුලා විගණනය - 2013 සූරිය වැව දිසා රෝහල | 975,544 |
| එස්එන්/ජීඑල්/බී/සෞ.සේ.//2011/01(vii) | 2011.03.31 | දේශීය බදු මුදල් ලෝක බැංකු අරමුදලින් දැරීම | - |
| එස්එන්/ජීඑල්/බී/සෞ.සේ.//2011/13(iii) | 2012.01.31 | වාහන අනතුරු හා ඒවා අයකර ගැනීමට කටයුතු නොකිරිම | 210,090 |
| එස්එන්/ජීඑල්/බී/සෞ.සේ.//2012/02 | 2013.07.18 | විශේෂ විගණන පරීක්ෂණය නෙළුව ග්‍රාමීය රෝහල සතු දෙමහල් ගොඩනැගිල්ල පවරාදීම | 542,094 |
| එස්එන්/එච්එම්ජ්/ප්‍රාසෞ.සේ./මු.වි./පස./2008/03/02 | 2008.07.14 | අංක 43-0670 දරන ගිලන් රථයේ දෛනික ධාවන සටහන් පරික්ෂාව රජයේ රෝහල - මීද්දෙණිය | |
| එස්එන්/එච්එම්ජ්/ප්‍රාසෞ.සේ./මු.වි./පස./2008/03/11 | 2008.10.31 | අග්‍රිම ශේෂ නොපියවීම | |
| එස්එන්/එච්එම්ජ්/ප්‍රාසෞ.සේ./මු.වි./පස./2008/03/13 | 2008.10.31 | නිල වාහන පිළිබඳ පරික්ෂාව | |
| එස්එන්/එච්එම්ජ්/ප්‍රාසෞ.සේ./මු.වි./පස./2008/03/09 | 2008.10.31 | අංක 56-6704 දරන වාහනයේ රිය අනතුර පරික්ෂාව | |
| එස්එන්/එච්එම්ජ්/ප්‍රාසෞ.සේ./මු.වි./පස./2008/03/14 | 2008.11.17 | විසර්ජන සම්මත වැය ලෙජරය - 2008 | |
| එස්එන්/එච්එම්ජ්/හ.දි./සෞ.සේ./මුවි/පස/2009/04/02 | 2009.08.24 | පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක නොකිරීම | 328,355 |
| එස්එන්/එච්එම්ජ්/හ.දි./සෞ.සේ./මුවි/පස/2009/04/08 | 2009.09.25 | භාණ්ඩ සමීක්ෂණය - 2008 | |
| එස්එන්/එච්එම්ජ්/හ.දි./සෞ.සේ./මුවි/පස/2009/04/10 | 2009.09.25 | නිල ඇඳුම් සඳහා රෙදි ලබාගැනීම | |
| එස්එන්/එච්එම්ජ්/හ.දි./සෞ.සේ./මුවි/පස/2009/04/15 | 2009.09.28 | පොදු තැන්පත් ගිණුම පිළිබඳ පරික්ෂාව | 2,200,974 |
| එස්එන්/එච්එම්ජ්/හ.දි./සෞ.සේ./මුවි/පස 2009/04/19 | 2010.03.15 | ව්‍යාපෘති විගණනය - ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන අරමුදල - 2009 | 72,076,805 |
| එස්එන්/එච්එම්ජ්/හ.දි./සෞ.සේ./ අත්.බි.ගි./2010/06 | | පළාත් රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුම - විගණනය | |

| | | | |
|---|---|---|---|
| එස්එන්/එච්එම්ජ්/හ.දි./සෞ.සේ./අත්.බී.ගි.2011/14 | 2012.05.29 | පළාත් රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුම විගණනය | |
| එස්එන්/එච්එම්ජ්/හ.දි./සෞ.සේ.අධ/පෙත්/2011/02 | 2011.06.20 | බෙලිඅත්ත දිසා රෝහලේ විගණන පරීක්ෂාව | |
| එස්එන්/එච්එම්ජ්/හ.දි./සෞ.සේ./මුවි/පස/2012/04/04 | 2012.11.14 | හම්බන්තොට දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල භූමියේ ඉදිකර ඇති ලය චිකිත්සාගාර ගොඩනැගිල්ල | 36,000,000 |
| එස්එන්/එච්එම්ජ්/හ.දි./සෞ.සේ./මුවි/පස/2009/04/(7) | 2012.11.17 | අවිධිමත් ලෙස වැටුප් ගෙවීම | |
| එස්එන්/එච්එම්ජ්/හ.දි./සෞ.සේ./අත්.බී.ගි.2012/14 | 2013.05.07 | පළාත් රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුම - විගණනය | |
| එස්එන්/එච්එම්ජ්/තං.මු.රෝ./අත්.බී.ගි.2010/17 | | පළාත් රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුම - විගණනය | |
| එස්එන්/එච්එම්ජ්/තං.මු.රෝ./අත්.බී.ගි.2011/15 | 2012.05.29 | පළාත් රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුම - විගණනය | |
| එස්එන්/එච්එම්ජ්/තං.මු.රෝ./අත්.බී.ගි.2012/15 | 2013.05.07 | පළාත් රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුම - විගණනය | |
| එස්එන්/එච්එම/ජ්/අම්.රෝ./මුවි/පස/2013/02 | 2013.09.09 | මූල්‍ය විගණනය -2013 සූරියවැව දිසා රෝහල | 25,800 |

## දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### ගාල්ල දිස්ත්‍රික්කය

| | | | |
|---|---|---|---|
| එස්එන්/ජීඑල්/ඩී/අධ්‍යා.දෙපා./මු.වි./2012/26 | 2013.04.30 | ද.ප.අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 6,619,880 |
| එස්එන්/ජීඑල්/ඩී/කඅගා./පාසැල්/මු.වි./2013/09 | 2013.08.27 | ගා/ශ්‍රීරතනසාර මහා විද්‍යාලය | - |
| එස්එන්/ජීඑල්/ඩී/කඅඅම්./පාසැල්/මු.වි./2012/25 | 2013.01.16 | ගා/බටපොල මහා විද්‍යාලය | - |
| එස්එන්/ජීඑල්/ඩී/කඅඅම්./පාසැල්/මු.වි./2013/08 | 2013.08.14 | ගා/පී.ද.එස්.කුලරත්න මහා විද්‍යාලය | - |
| එස්එන්/ජීඑල්/ඩී/කඅඋඩු./මු.වි./2012/17 | 2013.01.28 | -එම- | - |
| එස්එන්/ජීඑල්/ඩී/කඅඋඩු./මු.වි./2012/21 | 2013.01.31 | -එම- | - |

**මාතර දිස්ත්‍රික්කය**

| | | | |
|---|---|---|---|
| එස්එන්/එම්/ආර්/ඒ/අධ්‍යා./2013/11/වි.1 | 2013.12.19 | | - |
| එස්එන්/එම්/ආර්/ඒ/කලාප/අධ්‍යා./මොර/07 | 2013.09.04 | මොරවක කලාපය | 13,759,574 |
| එස්එන්/එම්/ආර්/ඒ/අධ්‍යා./2013/16/වි(2) | 2013.12.19 | - | 23,000 |
| එස්එන්/එම්/ආර්/ඒ/අධ්‍යා/2013/16/ වි(1) | 2013.12.19 | පිටබැද්දර මහා විද්‍යාලය | 8,200 |
| එස්එන්/එම්/ආර්/ඒ/අධ්‍යා/2013/16/ වි(3) | 2013.12.19 | - | - |
| එස්එන්/එම්/ආර්/ඒ/අධ්‍යා/මූල/2013/ 05 | 2013.07.29 | මුලටියන කලාපය | 7,640,032 |
| එස්එන්/එම්/ආර්/ඒ/අතුමවි/2013/12/ වි(1) | 2013.11.25 | මා/අතුරලිය මහා විද්‍යාලය | 55,552 |
| එස්එන්/එම්/ආර්/ඒ/අධ්‍යා/2013/10/ වි(1) | 2013.12.09 | මාර/මොටාගෙදර බණ්ඩාරනායක මහා විද්‍යාලය | 107,962 |
| එස්එන්/එම්/ආර්/ඒ/අධ්‍යා/2013/15/ වි(1) | 2013.12.27 | බතීගම මහා විද්‍යාලය | 251,481 |
| එස්එන්/එම්/ආර්/ඒ/අධ්‍යා/2013/15/ වි(5) | 2013.12.27 | -එම- | - |

**හම්බන්තොට දිස්ත්‍රික්කය**

| | | | |
|---|---|---|---|
| එස්එන්/එච්එම්/ඒ/හකඅ/ර.අ.බි.ගි./2012/16 | 2013.09.18 | හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලය | - |
| එස්එන්/එච්එම්/ඒ/සමවි/පෙත්/2013/04/වි-01 | 2013.11.08 | -එම- | - |
| එස්එන්/එච්එම්/ඒ/හකඅ/මුවි/පස/2013/11/වි.01 | 2013.11.21 | -එම- | - |
| එස්එන්/එච්එම්/ඒ/හකඅ/මුවි/පස/2013/11/වි.02 | 2013.11.27 | -එම- | - |
| එස්එන්/එච්එම්/ඒ/හකසඅවි/පෙත්/2013/05/වි.01 | 2013.12.30 | -එම- | - |
| එස්එන්/එච්එම්/ඒ/තංකඅ/අත්බිගි/2012/17 | 2013.05.14 | තංගල්ල කලාප අධ්‍යාපන කාර්යාලය | - |
| එස්එන්/වඑම්/ඒ/වකඅ/අ.බි.ගි./2012/18 | 2013.05.14 | වලස්මුල්ල කලාප අධ්‍යාපන කාර්යාලය | |

| | | | |
|---|---|---|---|
| එස්එන්/ජීඑල්/ඩී/අධ්‍යා.දෙපා./මු.වි./2010/11 | 2011.01.13 | ද.ප.අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 397,425 |

| | | | |
|---|---|---|---|
| එස්එන්/ජීඑල්/ඩී/කඅගා./2011/02 | 2012.09.07 | කලාප අධ්‍යාපන.ගාල්ල | 1,019,025 |
| එස්එන්/ජීඑල්/ඩී/කඅගා./2012/05 | 2012.09.07 | -එම- | - |
| එස්එන්/ජීඑල්/ඩී/කඅඅම්./2010/12 | 2010.12.10 | කලාප අධ්‍යාපන කාර්යාලය අම්බලන්ගොඩ | - |
| එස්එන්/ජීඑල්/ඩී/කඅගා./2010/26 | 2010.12.31 | ගෝනාපිනුවල සාරාලංකාර මහා විද්‍යාලය | - |
| එස්එන්/ජීඑල්/ඩී/කඅඋඩු/පාසැල්/මු.වි./2012/03 | 2012.12.21 | ගා/ශ්‍රී ධර්මාලංකාර මහා විද්‍යාලය | - |

**හම්බන්තොට දිස්ත්‍රික්කය**

| | | | |
|---|---|---|---|
| එස්එන්/එච්එම්ජී/හකඅ/රඅබිගි/2010/16 | 2011.10.31 | ර.නි.අ.හම්බන්තොට කලාපය -2010 | - |
| එස්එන්/එච්එම්ජී/හකඅ/රඅබිගි/2011/16 | 2012.07.31 | -එම- | - |
| එස්එන්/එච්එම්ජී/තංකඅ/අබිගි/2010/17 | 2011.10.31 | ර.නි.අ. 2010 තංගල්ල කලාපය | - |
| එස්එන්/එච්එම්ජී/හකඅ/අබිගි/2011/17 | 2012.07.31 | -එම- 2011 | - |
| එස්එන්/එච්එම්ජී/වකඅ/අත්බිගි/2010/18 | 2011.12.13 | -එම- 2010 වලස්මුල්ල කලාපය | - |
| එස්එන්/එච්එම්ජී/හකඅ/රඅබිගි/2011/18 | 2012.07.31 | -එම- 2011 | - |
| | | | 162,150,423 |